# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2346/12 – 2023 අගෝස්තු 21 වැනි සඳුදා – 2023.08.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/235.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.05.06 දිනැති හා අංක 2226/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.05.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, ඇල්හේන පාර, ජයසුන්දර පෙදෙස, අංක 10/21ඒ හි පිහිටි සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය (ඩී. කස්තුරි ආරච්චි මයා වෙනුවෙන්) සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A53/2021 හා 2023.07.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදීය.

නඩු අංකය - A/53/2021.
IR/COM/03/2019/235.

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය
(ඩී. කස්තුරිආරච්චි මහතා වෙනුවෙන්)
අංක 10/21ඒ,
ජයසුන්දර පෙදෙස,
ඇල්හේන පාර, මහරගම.

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

බේරුම්කරු විජිතානන්ද මඩවලගම.

පැමිණිල්ල වෙනුවෙන් සමස්ත ලංකා මෝටර් සේවක සමිතියේ සභාපති ඒ. ජේ. එච්. නිමන්ත හා ලේකම් පී. ජී. ප්‍රනාන්දු මයා.

වගඋත්තර ආයතනය වෙනුවෙන් නීති නිලධාරී නදීෂා අමරතුංග මහත්මිය හා නීතිඥ හංසිනී විජේසිංහ මහත්මිය.

ප්‍රදානය

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ විජිතානන්ද මඩවලගම වන මා පත්කර එය මා වෙත යොමුකර ඇත.

එහෙත් එම වකවානුවේ රටේ පැවති කොරෝනා උවදුර ඇතුළු අර්බුද රාශියක් හේතු කොටගෙන මෙම බේරුම්කරණ ක්‍රියාවලිය ප්‍රමාද විය.

මෙම නඩුව විමසීමට ගත් 2022.02.07 වැනි දින මා විසින් තීරණයක් දීමට විරුද්ධත්වයක් ඇත්දැයි දෙපාර්ශ්වයෙන්ම අසන ලදුව ඒවාට විරුද්ධත්වයක් නැති බව ඔවුන් ප්‍රකාශ කළහ.

එදින පැමිණිලිකරු වෙනුවෙන් ප්‍රකාශ කලේ ඔහු තෙල්දෙණිය, මීගමුව, කඩවත, ජාඇල ආදී ඩිපෝවල සේවය කර ඇති බවත් 2013 දී මීගමුව ඩිපෝවේ සේවය කරන කාලයේ සම්මුඛ පරීක්ෂණයකින් සහකාර කළමනාකාර ඉංජිනේරු ආවරණ තනතුරට පත් කරන ලද බවත් 2015 දී V වන ශ්‍රේණියට උසස් කළ බවත් ඒ සමගම ගම්පහ ඩිපෝවට මාරු කළ බවත් ප්‍රකාශ කළේය.

එහෙත් එවිට ගම්පහ ඩිපෝවේ ඉංජිනේරු මහත්තයෙක් හිටිය නිසා ඔහුව කිරිඳිවැල ඩිපෝවේම සේවයේ යොදවන ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි උපදෙස් දී තිබූ බවත් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේය.

මේ අවස්ථාවේදී නියෝගයක් දෙමින් මා ප්‍රකාශ කලේ දෙපාර්ශ්වයේම කරුණු දිවුරුම් පෙත්සම් මඟින් ඉදිරිපත් කරන ලෙසය. ඉන්පසු ප්‍රති දිවුරුම් පෙත්සම් ද ඉදිරිපත් කරන ලෙසය.

2022.04.25 වැනි දින නඩුව කැඳවූ අවස්ථාවේ මා නිරීක්ෂණය කළේ දිවුරුම් ප්‍රකාශ හරියාකාරව ඉදිරිපත්කර නැති බවයි. එබැවින් දිවුරුම් ප්‍රකාශ නැවතත් ඉදිරිපත් කිරීමට දෙපාර්ශ්වයටම නියම කරන ලදී. දැන් දෙපාර්ශ්වයම දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇති හෙයින් ඒ අනුව ප්‍රදානය නිකුත් කරමි.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් මා වෙත යොමු කරන ලද ආරාවුල වනාහී,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කිරිදිවැල ඩිපෝවේ සහකාර කළමනාකාර (ඉංජිනේරු) (ආවරණ) තනතුරේ සේවය කරන ඩී. කස්තුරි ආරච්චි මහතාට 2017.04.03 දින සිට බල පැවැත්වෙන පරිදි V වන ශ්‍රේණියට උසස් කර සහකාර කළමනාකාර (ඉංජිනේරු) තනතුරේ සේවය කිරීම සඳහා ලබා දුන් පත්වීම පසුව අවලංගු කර ඔහුව ආපසු කලින් සිටි තනතුරට පහත දැමීම යුක්ති සහගත ද එසේත් නැත්නම් ඩී. කස්තුරි ආරච්චි මහතාට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

ඒ අනුව 2022.05.27 දිනට පෙර නඩුවේ විස්තරය දිවුරුම් ප්‍රකාශයකින් ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කාර පාර්ශ්වය නියම කරන ලද අතර ඊට ප්‍රති උත්තර වශයෙන් වගඋත්තරකාර පාර්ශ්වය 2022.06.21 වැනි දින දිවුරුම් පෙත්සම් ඉදිරිපත් කරන ලෙස ද නැවතත් පිළිතුරු දීමට අවශ්‍ය නම් ඉල්ලුම්කාර පාර්ශ්වය 2022 ජූලි මස 14 වැනි දින දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස ද නියෝග කරන ලදී.

ඒ අනුව පාර්ශ්වයන් ඉදිරිපත් කරන ලද දිවුරුම් (ප්‍රතිඥා) පත්‍ර දෙපාර්ශ්වයේ ලිඛිත දේශන ගැන මාගේ අවධානය යොමු කළෙමි. මෙම ඉල්ලුම්කරු 2022.02.26 දින හා 2022.04.28 දිනැතිව දිවුරුම් පෙත්සම් දෙකක් ඉදිරිපත් කර ඇත. 2022.02.26 දිනැති දිවුරුම් ප්‍රකාශයේ 8 වන ඡේදය අනුව,

(i) පැමිණිලිකරුව 2013.07.15 දින පැවති සම්මුඛ පරීක්ෂණයේ කිරිදිවැල ඩිපෝවේ සහකාර කළමනාකාර ඉංජිනේරු තනතුර ආවරණය කිරීමට පත් කර ඇත. එකී පත්වීමේ ලිපිය A 1 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. (එම ලිපිය අනුව ඔහුගේ වැටුපේ කිසිදු වෙනසක් නොවන බව ද දක්වා ඇත.)

(ii) 9 වන ඡේදය අනුව පැමිණිලිකරුව 2015.02.27 වැනි දින දී කිරිදිවැල ඩිපෝවේ සහකාර කළමනාකාර ඉංජිනේරු තනතුර ආවරණය කිරීමට පත් කර ඇත. එකී පත් කිරීමේ ලිපිය A 2 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇත. (එම ලිපිය අනුව ඔහුගේ වැටුපෙහි කිසිදු වෙනසක් සිදු නොවන බව ද දැක්වේ.)

(iii) 10 වන ඡේදය අනුව 2017.03.28 වැනි දින ඉල්ලුම්කරුව V වන ශ්‍රේණියට උසස් කර සහකාර කළමනාකාර ඉංජිනේරු තනතුරට පත් කර ඇත. එම ලිපිය A 3 ලෙස ලකුණු කර ඇත. එකී A 3 ලෙස ලකුණු කළ ලිපිය අනුව ඉල්ලුම්කරුට උසස්වීමක් දී ගම්පහ ඩිපෝවට මාරු කර ඇත.

එම A 3 ලිපියේ අවසාන වාක්‍ය අනුව ඉල්ලුම්කරු භාරයේ ඇති ලිපි ලේඛන හා භාණ්ඩ විධිමත්ව බාර දිය යුතුය. මෙම නඩුවේදී මතු වී ඇති විසඳනාව නම් ඉල්ලුම්කරු ගම්පහ ඩිපෝවේ සේවයට වාර්තා නොකළේ මන්ද - එසේ ගම්පහ ඩිපෝවට වාර්තා නොකර කිරිදිවැල ඩිපෝවේම සේවය කිරීමට පිළිගත හැකි හේතුවක් තිබේද යන්නයි.

මේ පිළිබඳව ඉල්ලුම්කරු 2022.02.07 වැනි දින මෙම බේරුම්කරණයේ දී කළ වාචික සැලකිරීම කෙරෙහි අවධානය යොමු කරමි. 2022.02.07 වැනි දින නඩු වාර්තා සටහන් වල 3 වන පිටුවේ 4 වන පේළියේ සිට,

''2015 නැවත නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ සම්මුඛ පරීක්ෂණ තියලා මම 5 වන ශ්‍රේණියට උසස් කළා. ඒ උසස්වීම දීලා ඒ ලිපිය එක්ක මට දුන්නා ගම්පහ ඩිපෝවට මාරුවීම් යන්න කියලා. එතකොට ගම්පහ ඩිපෝවේ ඉංජිනේරු මහත්තයෙක් හිටිය නිසා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කාර්මික යන ප්‍රාදේශීය පාලක තනතුරට දන්වල තිබුණා මාව කිරිදිවැල ඩිපෝවේ සේවයට යොදවන්න කියා.''

තව ද සමස්ථ ලංකා මෝටර් සේවක සමිතිය විසින් කාර්මික අධිකරණයට 2021.07.22 දිනැතිව ඉදිරිපත් කරන ලද අයදුමේ සඳහන් වන්නේ ද මෙසේය.

''2017.03.28 දින සිට V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර ඉංජිනේරු තනතුරට පත්කර වැටුප් ගෙවා ඇති බවයි. තවද එසේ තිබිය දී ඔහුට ලබා දී තිබූ ස්ථාන මාරුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මහතාගේ උපදෙස් පරිදි ගම්පහ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර තැන විසින් අත්හිටුවා කිරිදිවැල ඩිපෝවේම සේවය කරන ලෙස දන්වා ඇති බවයි. මේ අනුව උසස්වීම ලැබූ ඉල්ලුම්කරු A 3 ලෙස අංකිත ලේඛනය අනුව මාරු කරනු ලැබූ ගම්පහ ඩිපෝවේ රාජකාරියට වාර්තා නොකළේ වගඋත්තරකාර සමාගමේ උසස් නිලධාරින්ගේ අවශ්‍යතාවය මත බව පෙනී යයි.''

ඉල්ලුම්කරුගේ මෙම කතාව ඔහු විසින් ඉදිරිපත් කරන ලද 2022.02.26 දිනැති දිවුරුම් පෙත්සමේ 11 වන ඡේදය සමග කියවිය යුතු A 4 නම් ලිපියේ ඇති වගුවේ සඳහන් වන්නේ ඩී. කස්තුරි ආරච්චි නමැති ඉල්ලුම්කරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කාර්මික) තැනගේ දුරකථන උපදෙස් අනුව සේවයේ අවශ්‍යතාවය මත ඔහු කිරිදිවැල ඩිපෝවේ සේවය කරන බවයි. ආයතනවල සේව්‍ය සේවක සම්බන්ධතාවයන්, පණිවිඩ හුවමාරු, නියෝග, උපදෙස් ආදිය ලිඛිතව මෙන්ම වාචිකව ද සිදු කෙරේ. සමහර විට දුරකථන මඟින් (වර්තමානයේ නම් SMS මඟින් හෝ E-mail මඟින්) සන්නිවේදන සිදු කෙරේ.

A 4 ලිපිය නිකුත් කර ඇත්තේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පහ ප්‍රාදේශිකයේ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකරු විසින්ය. මෙම ලිපියේ ඇති කරුණු සේවායෝජක පක්ෂය ප්‍රතික්ෂේප කර නැත. එහෙත් සේවා යෝජක පක්ෂය ඉදිරිපත් කළ 2022.06.21 දිනැති දිවුරුම් පෙත්සමේ අමුණා ඇති X 5 නම් ලිපිය අනුව, ඉල්ලුම්කරුට දුන් පත්වීම අවලංගු කර ඇත.

මෙම ඉල්ලුම්කරු ගම්පහ ඩිපෝවේ සේවයට වාර්තා නොකළේ උසස් නිලධාරීන්ගේ උපදෙස් මත හා සේවා අවශ්‍යතා මත බව X 5 නමැති පත්වීම අවලංගු කළ නිලධාරියා නොදන්නවා විය හැකිය. අනිත් අතට මෙම උසස්වීම හා මාරුවීම ලැබෙන විට ඉල්ලුම්කරු කිරිදිවැල ඩිපෝවේ සියලුම ඉංජිනේරු උපකරණවල බලධාරියාව සිටි බැවින් ගම්පහ ඩිපෝවට මාරු වී යාමට නම් සියලුම යාන්ත්‍රික උපකරණ ලිඛිතව සේවයට වාර්තා කරන ඩිපෝ සහකාර කළමනාකාර ඉංජිනේරු තැනට බාර දිය යුතුය.

එහෙත් එවකට එසේ බඩු බාර ගැනීමට එවීමට ඉංජිනේරු මහතෙක් නොමැතිවීම මත ස්ථාන මාරුව ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාර තැන හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාර කාර්මික තැන විසින් අවලංගු කර ඇත. (ඉල්ලුම්කරුගේ 2022.04.28 දිනැති දිවුරුම් පෙත්සමේ 4 වන ඡේදය)

කලින් කී ලෙස මෙවැනි නියෝග වාචිකව, ලිඛිතව, දුරකථන ඇමතුම් මඟින් ලබා දිය හැකිය. මෙම සිද්ධියෙන් පසු ඔහු සේවය අතහැර ගොස් නැත. ඔහු කිරිදිවැල ඩිපෝවේ සේවය කර ඇත්තේ සියල්ලන්ගේම දැනුවත්භාවය මත විය යුතුය. කිසිවෙකුට තමා කැමති තැනක තමන්ට අවශ්‍ය අයුරින් රාජකාරි කළ නොහැක. මෙම සිද්ධියේ දී ඉල්ලුම්කරු කටයුතු කර ඇත්තේ උසස් නිලධාරීන්ගේ දැනුවත්කම හා අනුමැතිය මතය.

මෙම දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ හුවා දක්වා ඇත්තේ ඉල්ලුම්කරු විසින් කොන්ත්‍රාත්තුව ප්‍රතික්ෂේප කර ඇති බවයි. එම තර්කය වැරදිය.

මෙහිදී ඉල්ලුම්කරු තම මෙහෙයවීමෙන් ගිවිසුම කඩකර නැත. ඔහු තම උසස් නිලධාරීන්ගේ කීම මත කටයුතු කර ඇත. එනම් මූලික ගිවිසුම අනුව කටයුතු නොකිරීමට උපදෙස් දී ඇත්තේ වගඋත්තරකාර ගමනා ගමන මණ්ඩලයේ නිලධාරීන්ය. ඒ අනුව ඉල්ලුම්කරුට වරද පැටවීමට වගඋත්තරකාර පක්ෂයට නොහැක.

මෙහිදී සිදුවී ඇත්තේ ගිවිසුමක් ප්‍රතික්ෂේප කිරීම නොව - උසස් නිලධාරීන්ගේ උපදෙස් මත ගිවිසුම ව්‍යර්ථවීමකි. තව ද ඉල්ලුම්කරු පහත හෙලන ලද තනතුරේ වසර 5 ක් සේවය කිරීම මත කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට එකඟත්වය දී ඇතැයි ලද බොළඳ තර්කයක් වගඋත්තරකාර පක්ෂය ඉදිරිපත් කර ඇත. ඉල්ලුම්කරුව තනතුරෙන් පහත හෙලූ පසු ඔහු එම තනතුරේවත් රැකියාව කිරීම හැර වෙන මොනවා කරන්නද?

එබැවින් වගඋත්තරකාර පක්ෂයේ ලිඛිත දේශනයේ ඇති තර්ක ප්‍රතික්ෂේප කරමි.

ඉල්ලුම්කරු තවමත් තමන්ගේ සුදුසුකම් අනුව සේවය කරයි. ඔහුට දුන් අවලංගු කරන ලද තනතුර නැවතත් ඉල්ලුම්කරුට ලබා දීමෙන් සේවායෝජකට කිසිදු අලාභයක්, අවාසියක් සිදු නොවේ. එබැවින් 2017.08.22 සිට මෙම ඉල්ලුම්කරුට නැවතත් V වන ශ්‍රේණියේ සහකාර කළමනාකාර ඉංජිනේරු තනතුරට පත්කරන මෙන් නියෝග කරමි.

තවද එම තනතුරට අදාළව වර්තමානයේ නියමිත වැටුප දෙන ලෙස ද නියම කරමි. ඒ අනුව බේරුම්කාර ප්‍රදානය දීමට ප්‍රථම ඉල්ලුම්කාර පාර්ශ්වයට ලැබිය යුතු ඉල්ලුම්කරුගේ වැටුපෙන් අඩු කරන ලද මුදල් ප්‍රමාණය කොපමණදැයි දන්වන ලෙස නියෝග කරන ලදී. වගඋත්තරකාර පාර්ශ්වය ඉදිරිපත් කරන ලද 2023.06.12 දිනැති දිවුරුම් පෙත්සම අනුව වගඋත්තරකරුට ලැබිය යුතු සම්පූර්ණ හිඟ මුදල රු. 153,325.00 කි. මෙම අගය ඉල්ලුම්කාර පාර්ශ්වය ද පිළිගන්නා ලදී. ඒ අනුව 2017.08.22 සිට මේ දක්වා

ඉල්ලුම්කරුගේ වැටුපෙන් අඩු කරන ලද මුදල රු. 153,325.00 (එක්ලක්ෂ පනස් තුන්දහස් තුන්සිය විසිපහ) *ගැසට්* ගත කිරීමෙන් මසක් ඇතුළත නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කර ඉල්ලුම්කරුට ගෙවන මෙන් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව ප්‍රකාශ කරමි.

**විජිතානන්ද මඩවලගම,**
බේරුම්කරු.

2023 ජූලි මස 31 වැනි දින දී ය.

EOG 08 - 0227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.